# වාර්ෂික වාර්තාව
# 2009



## උද්භිද උද්‍යාන භාර අරමුදල

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුබ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2009 (Annual Report – 2009)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුබ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996-02-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ ශුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා ශුභ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් වෙන් කරනු ලබන අතර, මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය එය වේ. ඊට අමතරව අරමුදල ආදායම වැඩිකර ගැනීම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනීමට ඉඩකඩ සලසා ඇත.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුබ සාධනය සඳහා භාර අරමුදල
2. ස්වභාවය : උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම.
3. අදාල චක්‍රලේඛයන් : I) අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව
   II) ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය
4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20
5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව ගිණුම් අංක 7040848

7. අරමුදලේ පරමාර්ථ :

අ) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් තුළ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

ආ) පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩ සටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම

ඇ) උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට මූල්‍යමය ආධාර සැපයීම

ඇ) ශාක එකතුව පිළිබවඳව වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම

ඉ) උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂෙත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම

ඊ) විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදි කිරීමේ කටයුත්තක් භාර ගැනීම

උ) විශේෂිත වැඩ සටහනකදී පුනරාවර්තන අරමුදල් හිඟය පියවා ගැනීම

## අරමුදලේ මුදල් ප්‍රගතිය

| | | |
|---|---|---|
| 2009-01-01 දිනට බැර ශේෂය | = | රු. 40,801,360.00 |
| එකතු කළා: | | |
| 2009 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. 27,150,856.00 |
| | | ----------------- |
| | | රු. 67,952,216.00 |
| අඩු කළා : | | |
| 2009 වර්ෂයේ වියදම (හර කිරීම්) | = | රු. 20,530,086.00 |
| | | ----------------- |
| 2009-12-31 භාණ්ඩාගාර ශේෂය | = | රු. 47,422,130.00 |
| | | =========== |

## අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2009 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

- උද්භිද උද්‍යාන නඩත්තු වියදම් යටතේ උද්‍යාන නඩත්තු කරගෙන යාම සඳහා යොදවා ගනු ලබන කොන්ත්‍රාත් කම්කරු වැටුප් සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ හෙයින් අරමුදල යටතේ රු.මි. 2.4 ක වියදමක් දරා ඇත. එයට අතිරේකව වාහන අලුත්වැඩියා, කොන්ත්‍රාත් කරුවන්ගේ රඳවා ගත් මුදල් ගෙවීම හා

අරමුදල් කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ජායා පිටපත් යන්ත්‍රයක් ලබා ගැනිම සිදු කර ඇත.

- උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරිම යටතේ සේවයේ නියුතු විවිධ මට්ටමේ තනතුරුවල සේවකයින් පුහුණු කිරිම, නිල ඇඳුම් ලබාදිම, මල්පැල බීජ හා රෝපණ ද්‍රව්‍ය දේශිය හා විදේශිය වෙළඳපලින් ලබාගැනිම සිදුකර ඇත.

- පේරාදෙණිය උද්භිද උද්‍යානය සංවර්ධනය යටතේ ගස් නඩත්තුව පිණිස යොදාගන්නා අවශ්‍ය විශෙෂ උපකරණ ඕස්ට්‍රේලියාවෙන් මිලට ගැනිම, උද්‍යානය තුළ ගොඩනැගිලි අලුත්වැඩියාව හා අධ්‍යාපන හා පුහුණු අංශයට ලි බඩු හා උපකරණ මිලට ගැනිම සිදුකර ඇත.



ඕස්ට්‍රේලියාවෙන් මිලට ගන්නා ලද උපකරණ වලින් කිහිපයක්



ඕස්ට්‍රේලියාවෙන් මිලට ගන්නා ලද ගස් කැපිමට යොදාගන් විශේෂිත උපකරණ වලින් කිහිපයක්



ඕස්ට්‍රේලියාවෙන් මිලට ගන්නා ලද උපකරණ වලින් ඩිප්ලොමා සිසුවෙකු පුහුණු වන අවස්ථාවක්

- හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය යටතේ දැනට ඇති පැලෑටි ගෘහයන්ට අමතරව හොඳ තත්වයේ පැලෑටි ගෘහ තුනක් ඉදි කරවා ගැනීමට කටයුතු කර ඇත.

- ගම්පහ උද්භිද උද්‍යානයේ සංවර්ධනය යටතේ කාණු, බෝක්කු හා පාරවල්වල සුලු අලුත්වැඩියාවන් සිදුකර ඇති අතර නව සංවර්ධිත කොටස සඳහා අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම පිණිස රු.මි. 1.4 ක මුදලක් වැය කරන ලදි.




ගම්පහ උද්භිද උද්‍යානයේ අලුතින් ඉදිකරන ලද ගේට්ටුව



ගම්පහ උද්භිද උද්‍යානයේ අලුතින් ඉදි කරන ලද පාලම

- අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ 2008 වර්ෂයේදී ඉදි කිරීම් ආරම්භ කරන ලද පැලෑටි ගෘහයන් දෙක සඳහා මෙම වර්ෂයේදී රු. මිලියන 2.1 ක වියදමක් දරා ඇති අතර මෙම වර්ෂයේ ආරම්භ කරන ලද කාර්යාල ගොඩනැගිල්ල සඳහා මූලධන වියදම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අරමුදල යටතේ රු.මි. 3.1 ක වියදමක් දරා ඇත.



අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ අලුතින් ඉදි කරන ලද පොලි ටනල්



අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ ඉදි කෙරෙමින් පවතින කාර්යාල ගොඩනැගිල්ල

- ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ අලුතින් ඉදි කරන ලද ශ්‍රවනාගාරය හා කාර්යාල ගොඩනැගිල්ලට අවශ්‍ය ලී බඩු හා උපකරණ මිලට ගැනීම සඳහා රු. 452,489/- ක වියදමක් දරා තිබේ.

## අරමුදල යටතේ කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන් :

| කාර්යය | වියදම |
|---|---|
| 1. උද්භිද උද්‍යාන පහසුකම් වැඩි දියුණු කිරීම | රු. 1,662,368.00 |
| 2. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධන කටයුතු | රු. 4,522,842.00 |
| 3. හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධන කටයුතු | රු. 2,109,714.00 |
| 4. ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධන කටයුතු | රු. 2,619,771.00 |
| 5. අවිස්සාවේල්ල උද්භිද උද්‍යානය සංවර්ධන කටයුතු | රු. 5,256,424.00 |
| 6. ජාතික ශාකාගාරය සංවර්ධනය සංවර්ධන කටයුතු | රු. 200,766.00 |
| 7. ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට උපකරණ මිලදී ගැනීම | රු. 452,489.00 |

එස්. ලියනගම
සභාපති, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ ලේකම්
ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය

එස්. ලියනගම
ලේකම්
ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය
7 ඒ, රීඩ් මාවත, කොළඹ 07.

ආචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර
ලේකම්, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.